# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2481/25 - 2026 මාර්තු මස 27 වැනි සිකුරාදා - 2026.03.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* : KDS/KGK/4/2 (2)/2018/2/5.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/12/2018/WS/318.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම් විස්තරය* :

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත්සතර හා ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අස්ගිරිය (235) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අස්ගිරිය (කොට්ඨාස අංක 6 අස්ගිරිය මහනුවර මහනගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන සකස් කරන ලද 2025.06.13 දිනැති කැඩැස්තර සිතියම් අංක 320418හි කලාප අංක 03හි පත්‍ර අංක 01හි කැබලි අංක 1, 2, 3, 4හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0346ක් වූ පහත සඳහන් ඉඩම් කැබලි.

**01.** කැබලි අංක **1**
ඉඩමේ නම: නියදගලේහේන; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: කහවිටගේ නිමාලි පෙරේරා; ප්‍රමාණය: හෙක්. 0.0035.

**02.** කැබලි අංක **2**
ඉඩමේ නම: නියදගලේහේන; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: විහාරාධිපති, ශ්‍රී විජයසුන්දරාරාමය, අස්ගිරිය, අයි. අබේසේකර, එස්. අබේසේකර, නන්දා අබේසේකර, නිද්‍රා අබේසේකර, ජී. පතිරණ, අයි. පතිරණ; ප්‍රමාණය: හෙක්. 0.0224.

**03.** කැබලි අංක **3**
ඉඩමේ නම: නියදගලේහේන; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: කහවිටගේ නිමාලි පෙරේරා; ප්‍රමාණය: හෙක්. 0.0041.

**04.** කැබලි අංක **4**
ඉඩමේ නම: නියදගලේහේන; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: විහාරාධිපති, ශ්‍රී විජයසුන්දරාරාමය අස්ගිරිය, අයි. අබේසේකර, එස්. අබේසේකර, නන්දා අබේසේකර, නිද්‍රා අබේසේකර, ජී. පතිරණ, අයි. පතිරණ; ප්‍රමාණය: හෙක්. 0.0046.

ඉහත සඳහන් ඉඩම්වලට/පරවශතාවයන්ට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026.05.28 දින පෙ. ව. 10.00ට මහනුවර කඩවත්සතර හා ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2026.05.21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී

ඉඩම්/පරවශතාවයන් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**අමිල නවරත්න,**
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත්සතර හා ගඟවටකෝරළේ.

2026 පෙබරවාරි මස 18 වැනි දින,
මහනුවර කඩවත්සතර හා ගඟවටකෝරළේ
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0224

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* : KDS/TUM/04/01/01/14.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබාගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය* :

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 298 හිත්ගොඩවල්පොල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බැබිලපිටිය ගමේ පිහිටි මහනුවර මැනුම් අධිකාරී විසින් පිළියෙළ කරන ලද මූලික ගම් පිඹුරු අංක ක. සි. 321268/01/01 හි පහත සඳහන් බිම් කැබැල්ල.

**01. කැබලි අංක 1**

ඉඩමේ නම: බැබිලපිටිය වත්ත නොහොත් ශාන්ත ජෝන් වත්ත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: ජී. ඒ. ජී. අනුර කුමාර සිරිවර්ධන; ප්‍රමාණය: හෙක්. 0.0779.

උතුරට: මාර්ගය; නැගෙනහිරට: අ.ග.පි.142හි 5 වැනි බිම් කැබැල්ල; දකුණට: අ.ග.පි. 142හි 5 වැනි බිම් කැබැල්ල; බටහිරට: අ.ග.පි. 142හි 5 වැනි බිම් කැබැල්ල

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026.07.06 දින පෙ. ව. 10.00ට තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2026.06.18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**ආර්. එම්. එස්. එන්. රත්නායක,**
ප්‍රාදේශීය ලේකම්,
තුම්පනේ.

2026 මාර්තු මස 19 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0225

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.